00419
(05)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - හයවන මට්ටම
**LLU6814/ LWU4326 – දිලික්ත නීතිය**
අවසාන පරීක්ෂණය - 2017/18
කාලය පැය (03) තුනයි

---

දිනය ඃ 2020 මාර්තු 05 — වේලාවඃ ප.ව. 1.30 - ප.ව. 4.30

---

ඔබගේ අත් අකුරු පැහැදිලි විය යුතුය.

බලය නොලත් ලිපි ලේඛන ජංගම දුරකථන හෝ වෙනත් තාක්ෂණික උපාංග විභාග ශාලාවට රැගෙන ඒම විභාග වරදකි.

සෑම ප්‍රශ්නයක් සඳහාම එක සමාන ලකුණු ලැබේ.

ප්‍රශ්න (04) හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**01.** මෙම ආප්තය පදනම් වී ඇත්තේ මනා අවබෝධය සහ යුක්තිය මතය. තමන් කෙරෙහි බලපාන්නා වූ යම් කිසි ක්‍රියාවක් සිදු කිරීමට ආරාධනා කළ හෝ කැමැත්ත ලබා දුන් අයකුට එම ක්‍රියාව නිසා ඔහුට හානියක් සිදු වූ විට එය වරදක් බව දක්වමින් පැමිණිලි කිරීමට නොහැකිය.

*- Lord Herschell in Smith vs. Baker (1891) AC 325*

ඉහත උපුටා දැක්වීමේ සඳහන් ආප්තය කුමක්ද? එකී ආප්තයේ සඳහන් මූලිකාංග සහ විනිශ්චිත නඩු තීරණවලදී එම ආප්තය අර්ථ නිරූපණය කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

**02.** ජනක සහ නාලිනී ඔවුන්ගේ සය හැවිරිදි පුතු නවීන්ගේ උපන්දින සාදයක් පැවැත්වූ අතර සාදයට ඔහුගේ පන්තියේ ළමයි කීපදෙනෙකු පැමිණියහ. සුළු මොහොතකට පසුව උපන්දින කේක් ගෙඩිය මත වන ඉටිපන්දම දැල්වීම සඳහා නාලිනී විසින් මේසය මත තබන ලද ගිනි පෙට්ටිය නවීන් සහ ඔහුගේ හොඳම මිතුරා වන රිස්වි සොයා ගත්හ. ඔවුහු ගිනි පෙට්ටිය සහ ඉටිපන්දම් රැගෙන නවීන්ගේ නිදන කාමරයට ගොස් ඒවා දැල්වීමට පටන්ගත්හ. දල්වන ලද ඉටිපන්දමක් නවීන්ගේ ඇඳ මත වැටීමෙන් ඇඳ ඇතිරිල්ල ගිනි ගැනීම සිදු විය. දරුවන් දෙදෙනා කාමරයෙන් ඉවතට දිව ගිය නමුත් ගින්න පිළිබඳ කිසිවෙකුට පැවසුවේ නැත .

ජනක නිදන කාමරයේ ජනේලයෙන් ගිනිදැල් පිටතට පැමිණෙනු දැක ගිනි නිවීමේ සේවයට ඇමතුමක් ලබා දුන්නේය. නාලිනී නිවස වටා දුව ගොස් නිවසේ සිටි සියලු ළමුන් ගෙවත්තට අඬ ගසා ගත්තාය. මෙම මොහොත වන විට ගිනි නිවීමේ රථය සහ කණ්ඩායම පැමිණි අතර ගින්න සම්පූර්ණ නිවසටම පැතිර තිබිණ. මාර්ගය පහළ නිවසක විසූ සිව් හැවිරිදි සුරේන් අතුරුදන් වී ඇති බව නාලනී අවබෝධ කර ගත්තාය. ගිනි නිවීමේ කණ්ඩායමේ ප්‍රධානියා වූ පෙරේරා සුරේන් සෙවීම සඳහා ගිනි ගන්නා නිවසට වහාම ඇතුල් වූ අතර ගින්න මැඩ පැවැත්වීමට ගිනි නිවන කණ්ඩායම උත්සහ කළහ. සිවිලිමේ කොටසක් ඔහු මත කඩා වැටීම නිසා පෙරේරා බරපතළ ලෙස තුවාල ලැබීය. මහනුවර ප්‍රදේශයේ මිතුරෙකු බැලීමට ගොස් සිටි සුරේන්ගේ මව වන නිර්මලාට අසල්වැසියෙකු විසින් දුරකථන ඇමතුමක් ලබා දී කියා සිටියේ ජනකගේ නිවස ගිනිගන්නා බවත් සුරේන් සොයා ගැනීමට නොහැකි වූ බවත්ය. ගැබිණියක වූ නිර්මලා ගබ්සාවට ලක් වූ අතර වහාම රෝහල් ගත කෙරිණ. පසුව සොයා ගනු ලැබුවේ සුරේන් ගසක් පිටුපස සැඟවී සිට ඇති බවත් ඔහු ආරක්ෂිත බවත් නමුත් ඔහු දැඩිව කම්පනයට (Traumatised) පත්ව ඇති බවත්ය.

පෙරේරා, නිර්මලා සහ සුරේන් සම්බන්ධයෙන් ජනකට සහ නාලනීට ඇති වගකීම සාකච්ඡා කරන්න.

**03.** නීතියේ ඇති වඩාත්ම වැදගත් වෙනස්කමක් වනුයේ යම්කිසි අයෙකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා තවත් පාර්ශවයකට අනතුරක් සිදු වී ඇති නම් ඒවා වෙනස් ආකාරයේ ප්‍රවේශයක් හරහා තීරණය කිරීමයි. පුද්ගලයන්ට හා අන් අයගේ දේපළට හානි සිදු කිරීමෙන් වැළකී සිටීම අවධානයේ යුතුකමේ එක් කාරණයකි. අනෙක් අතට අන් අයට ශුද්ධ මූල්‍ය හානි සිදු වීමෙන් වැළැක්වීම වෙනත් කාරණයකි.

- *Lord Bridge in Caparo Industries PLC vs. Dickman and others (1990) 1 All ER*

නොසැළකිලිමත් දුෂ්ප්‍රකාශ මත වගකීම පැවරීම සඳහා වූ රීති වෙනම අංශයක් ලෙස විකාශය වී ඇති ආකාරය ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න.

ශ්‍රී ලංකා දකුණු අප්‍රිකා සහ ඉංග්‍රීසි නීතිය ඔබ විසින් සාකච්ඡා කළ යුතුය.

**04.** බණ්ඩා ලොරි රථ රියදුරෙක් වූ අතර ඔහුගේ රියදුරු බලපත්‍රය අලුත් කර ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගියේය. එක්තරා අසනීප තත්වයක් සඳහා ඖෂධ ගැනීමට ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බණ්ඩා දවල් කාලය තුළ පවා දිගටම නිදිමත ස්වභාවයෙන් පෙළුනේය. වෛද්‍ය පරීක්ෂණයට ගිය විට ඔහු ඒ බව ඔහුගේ ලිපි ගොනුව භාරව සිටින වෛද්‍ය කුසල් වෙත දැනුම් දුන්නේය. වෛද්‍යවරයෙකු ලෙස පසුගිය වසරේ පත් වූ කුසල් එම ඖෂධ නිදිමත ස්වභාවයට හේතු වන බව දැන නොසිටියේය. ඔහු බණ්ඩා වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් කළේය. අමල්, භාණ්ඩ ප්‍රවාහනය සඳහා කුලියට ගත් ලොරි

00419

රථය පැදවීම සඳහා පසුව බණ්ඩා සේවයේ යෙදවූයේය. අමල් බණ්ඩාගේ නිර්දේශයන් සහ ආරක්ෂක රියදුරෙකු වශයෙන් වූ පසුගිය සේවා වාර්තා පරීක්ෂා කළේය. බණ්ඩා අමල් වෙත සේවය සැපයීම අරඹා මාස කිහිපයකට පසුව ශාන්ති ඇයගේ නිවස මාරු කිරීමේදී ඇයගේ ගෘහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථය කුලියට ලබා ගත්තාය. ශාන්තිගේ නව නිවසට ගෘහ භාණ්ඩ රැගෙන යමින් සිටින අතරතුර බණ්ඩාට නින්ද ගියේය. ලොරිය පාරෙන් ඉවතට ගොස් පාරේ පසෙක තිබූ  සිරිසේනගේ එළවළු වෙළඳ සැලට කඩා වැදුණි. සිරිසේන දරුණු ලෙස තුවාල ලැබුවේය. රුපියල් මිලියනයකට වඩා වැඩි වටිනාකමකින් යුතු වසර 300 කට වඩා පැරණි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත මේසයක් ඇතුළුව ලොරි රථයේ තිබූ ගෘහ භාණ්ඩද දැඩි ලෙස හානියට ලක්විය.

ශාන්ති සහ සිරිසේන ඔවුනට සිදු වූ හානි සහ පීඩාවන් සඳහා වන්දි අයකර ගැනීමට අපේක්ෂා කරති. ඔවුන් නඩු පැවරිය යුත්තේ කාටද? කුමන පදනමක් මතද යන්න පිළිබඳ ඔවුනට උපදෙස් දෙන්න.

**05.** නෛතික කාරණත්වය තීන්දු කරන මූලධර්ම රාශියක් වර්තමානයේ පවතින අතර එමගින් පරස්පර සහ ඒකාකරී නොවන තීන්දු ලැබී ඇත.  මෙම ගැටලුව විසඳීම සඳහා විනිශ්චයකරුවන්ගේ සාමාන්‍ය බුද්ධියට ඉඩ දිය යුතුය.

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර නෛතික කාරණත්වය පිළිබඳ රීති සහ නඩු තීරණ උදාහරණ මගින් දක්වමින් තහවුරු කරන්න.

**06.** තොරතුරු දැනගැනීමේ සහ භාෂණයේ ප්‍රකාශනයේ අයිතියට ඉහළින් අපහාසය පිළිබඳ නීතිය පුද්ගලයන්ගේ කීර්තිනාමය ආරක්ෂා කරයි.

ඔබගේ පිළිතුර නඩු තීරණ මගින් සනාථ කරමින් අපහාසය පිළිබඳ නීති තත්ත්වය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. වර්තමානයේ දී ශ්‍රී ලංකාව, දකුණු අප්‍රිකාව සහ ඉංග්‍රීසි නීතිය අදාළ වන ආකාරය සාකච්ඡා කළ යුතුය.

**07.** මාලා අර්ධ-ග්‍රාමීය ප්‍රදේශයක නිවසක වාසය කරයි. ඇයගේ නිවස අවට ඉඩම් හිමි බණ්ඩා රාමා සහ ටිකිරි ඇයගේ අසල්වැසියන්ය.

(අ) බණ්ඩාට කුකුල් ගොවිපළක් ඇත. කුකුල් ගොවිපළ දෙසින් සුළඟ හමන විට කුකුල් අපද්‍රව්‍ය වලින් හමා එන ගන්ධය දැරිය නොහැකි අතර දිවා කාලයේ කුකුළන්ගේ ශබ්දය මාලාගේ නිවසේ වාසය කරන්නන්ට බාධාකාරී වේ. ඇයගේ සේවිකාව වූ රම්‍යා තව දුරටත් එහි සේවය කිරීම ප්‍රතික්ෂේප කළාය. ඊට අමතරව, දැඩි නිර්මාංශිකයකු වන ඇගේ වයස්ගත පියා වන පෙරේරා ඇය සමඟ විසීමට පැමිණ

සිටින අතර දිනපතා කුකුල් ගොවිපලේ කුකුළන් මරණු ලබන්නේය යන සිතුවිල්ල ඔහුව මානසික පීඩාවට පත්කර ඇත .

(ආ) මෑතකදී තම ඉඩම මිලදී ගත් රාමා අවට ප්‍රදේශයේ වැවී ඇති තේ සැකසීම සඳහා තේ කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමෙහි නිරතව සිටී. ඔහුගේ ව්‍යාපාරය හැකි ඉක්මනින් ඇරඹීමේ අවශ්‍යතාව මත සේවකයන් රාත්‍රී කාලය තුළද බර යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් වැඩ කරයි. පෙරේරාට රාත්‍රියේ නිදා ගැනීමට නොහැකිය. රාමාගේ ඉඩමට මුහුණලා ඇති මුළුතැන්ගෙයි බිත්තියක පැලීමක් ඇති බව මාලාද නිරීක්ෂණය කළාය.

(ඇ) මාස 6 ට පෙර ඔහුගේ ඉඩම මිලදී ගත් මාලාගේ ආසන්නම අසල්වැසියා වන ටිකිරි ඉවතලන ලෝහ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ඔහු අබලි වාහන මිලට ගෙන එම කොටස් ලබා ගනියි. වාහන කැඩීමේ ශබ්දය දිවා කාලයේ මුළුල්ලේම කිලෝමීටර ගණනාවක් දුරට ඇසිය හැකිය. අසල්වැසියන්ට බාධා නොවනු පිණිස ටිකිරි සවස 5 ට වැඩ නවත්වයි.

බණ්ඩා, රාමා සහ ටිකිරිට එරෙහිව පුද්ගලික කරදරය පිළිබඳ නඩුකරයක් පැවරීමට හැකිදැයි මාලාට උපදෙස් දෙන්න.

**** *හිමිකම් ඇවිරිණි* ****